# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

**<u>සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පොත්බැඳුම්කරු තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) පුරප්පාඩු පිරවීම.</u>**
**<u>(තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 01කි)</u>**

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පොත් බැඳුම්කරු තනතුරට අදාලව **කොන්ත්‍රාත් පදනම යටතේ වසර දෙකක (02) කාලයක් සඳහා** පුරප්පාඩු පිරවීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**බාහිර අයදුම්කරුවන්**

තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් පොත් බැඳීමේ කටයුතු පිළිබඳ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. අදාල ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/වෘත්තීය පුහුණු ආයතනයකින් පොත් බැඳීමේ වෘත්තීයට අනුකූල වන, වෘත්තිය පරීක්ෂණයක (Trade Test ) දි තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන ( PL-1) සේවා ගණයක සේවකයින්.

   හෝ

2. තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් පොත් බැඳීමේ කටයුතු පිළිබඳ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප් පරිමාණය

PL – 2- රු**. 42,300 – 10x490 - 10x540 10x590 -12x630 = 66,060**
**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II අනුව 2027.01.01 දින දක්වා අදියරගත කාලසීමාව තුළ වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.**

- රජය විසින් අනුමත සියළුම දිමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

සෑම අපේක්ෂකයෙක්ම,

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**<u>තනතුරට අදාළ පොදු කොන්දේසි</u>**

1. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.

2. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.

3 අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.

4 අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.

5 අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**<u>අයදුම් කළ යුතු ආකාරය</u>**

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුලත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට **2026/02/20 දිනට පෙර** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරි**
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
1වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02